මව්බිම

- **ලිපිනය**
  සිලෝන් නිවුස්පේපර්ස් (පෞද්.) සමාගම, 101, රොස්මිඩ් පෙදෙස, කොළඹ 07.
- **දුරකතන (පොදු)**
  011-7566566
- **කර්තෘ මණ්ඩලය**
  011-7566502/ 011-7566503
- **ෆැක්ස්** - 011-7566514
- **වෙබ් අඩවිය** - www.mawbima.lk
- **ඊ.මේල්**
  mbnews@ceylonnewspapers.lk
- **බෙදාහැරීම්**
  011-7566583/ 011-7566584
- **ෆැක්ස්** - 011-7566587
- **දැන්වීම්**
  011-7566568/ 011-7566572
- **ෆැක්ස්** - 011-7566569

මානව හිමිකම් සැහැල්ලුවට ගත යුතුද?

මානව හිමිකම් සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන දෙස් විදෙස් පාර්ශ්වයන්ගේ විවේචනයට ලක්ව තිබෙන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සංශෝධනය කිරීමට අවශ්‍ය කරන සංශෝධනයන් ඇතුළත් අතුරු ගැසට්ටුව පසුගිය සතිය අගභාගයේදී ප්‍රකාශයට පත් කෙරිණි.

ඊට දින කිහිපයකට පෙර වසරේ පළමු වරට මෙරට විදෙස් රාජතාන්ත්‍රිකයන්ගේ හමුවක් කැඳවූ විදේශ කටයුතු අමාත්‍ය මහාචාර්ය ජී.එල්. පීරිස් මෙරට පවතින මානව හිමිකම් තත්ත්වයන් පිළිබඳව ඔවුන්ව දැනුවත් කිරීමට කටයුතු කළේය. එහිදී පවත්නා ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සංශෝධනය කිරීමට අවශ්‍ය කරන සංශෝධනයන් සඳහා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලැබුණු බවද ඔහු දැනුම් දුන්නේය.

පවත්නා පනතේ නියෝග ප්‍රකාරව අත්අඩංගුවට ගන්නා සැකකරුවකු රැඳවුම් නියෝග යටතේ හෝ රිමාන්ඩ් භාරයේ හෝ තබා ගත හැකි සම්පූර්ණ කාලසීමාව අත්අඩංගුවට ගත් දිනයේ සිට මාස 18 වන අතර අදාළ සංශෝධන මඟින් එය මාස 12 දක්වා අඩු කර ඇත. තවද එවන් සැකකරුවකුට අභියාචනාධිකරණය හරහා ඇප මත මුදා ගැනීමට හැකි වේ.

වධහිංසා සහ වෙනත් කුරිරු, අමානුෂික හෝ අවමන් සහගත සැලකීම් හෝ දඬුවම්වලට එරෙහි සම්මුතිය ප්‍රකාරව එවන් සැකකරුවකුට ආරක්ෂාව සැලසේ දැයි මහෙස්ත්‍රාත්වරයකුට ඔවුන් හමුවී පරීක්ෂා කොට තහවුරු කර ගැනීමට අදාළ සංශෝධන මඟින් හැකියාව ලැබේ.

මෙයට අමතරව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ ඉදිරියේදී රඳවා ගනු ලබන සෑම සැකකරුවකු පිළිබඳවම ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම දැනුවත් කළ යුතු වේ.

ශ්‍රී ලංකාවේ මානව හිමිකම් තත්ත්වය ගැන බොහෝ විවේචන පවත්නා සමයක මෙවන් සංශෝධනයන් සම්මත වී නීතිගත වීම යම් සාධනීය තත්ත්වයක් ඇති කරනු ඇත.

පසුගියදා මෙරටට පැමිණි එක්සත් රාජධානියේ දකුණු ආසියාව සහ පොදුරාජ්‍ය මණ්ඩලය පිළිබඳ ඇමැති තාරික් අහමඩ් සාමිවරයා ගැටුම් නිරාකරණය, මානව හිමිකම් ප්‍රවර්ධනය සහ සියලු ජනවර්ග අතර සංහිඳියාව සහ සමානාත්මතාව ගොඩනැඟීම වෙනුවෙන් 2022/23 වසර සඳහා එක්සත් රාජධානියෙන් ශ්‍රී ලංකාවට පවුම් මිලියන 3.7ක් පිරිනමන බව ප්‍රකාශ කළේය.

අහමඩ් සාමිවරයාගේ ශ්‍රී ලංකා සංචාරය අතරතුරදී විවෘත, සාධාරණ සහ සැමට සම අවස්ථා ලබා දෙන සමාජයක් සහ ආගමික නිදහස වෙනුවෙන් එක්සත් රාජධානියේ සහාය නිරන්තරයෙන් ශ්‍රී ලංකාවට ලැබෙන බවට ඔහු පොරොන්දු විය.

ශ්‍රී ලංකාවේ මානව හිමිකම් සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානය වෙත ඉදිරිපත් කර ඇති යෝජනාවේ ප්‍රධාන පාර්ශ්වකරුවකු වශයෙන් සිටියදී එක්සත් රාජධානිය විසින් මෙවැනි ප්‍රදානයක් ශ්‍රී ලංකාව වෙනුවෙන් ලබාදීමේ යම් යටි අරමුණක් තිබිය හැකි බවට ඇතැමකුට සැක පහළවීමට බොහෝදුරට ඉඩක් ඇත. පසුගිය දශකයකට අධික කාලයක් පුරා මානව හිමිකම් සම්බන්ධයෙන් පැනනඟින ඕනෑම සාකච්ඡාවක් සම්බන්ධයෙන් මෙරට සමාජයේ බහුතරයක් ඍණාත්මක කෝණයකින් බැලීමට හුරුවී ඇත. විශේෂයෙන්ම බටහිර රටවල් මේ සම්බන්ධයෙන් කරනු ලබන ඕනෑම ප්‍රකාශයක් මෙරටට එරෙහි ප්‍රකාශයක් ලෙස සැලකීමට අප සමාජය හුරුකරවා ඇත. නමුත් වටහාගත යුතු සත්‍යය වනුයේ ඕනෑම රටක විදෙස් ප්‍රතිපත්තීන් බහුවිද අරමුණු පෙරදැරි කර ගෙන සකස් කරන බවත් ඒ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා ඔවුන් විසින් රාජ්‍යතාන්ත්‍රික සබඳතා පවත්වන එක් එක් රටවල්වල සංවර්ධනය විය යුතු ක්ෂේත්‍රයන් වේ නම් ඒ සඳහා සද්භාවයෙන් යුතුව ආධාර කිරීමට ඉදිරිපත් වන බවත්ය.

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් මිෂෙල් බෂලේ (Michelle Bachelet) ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් වන අවසන් වාර්තාවේදී සඳහන් කළ වඩාත් වැදගත් කාරණයක් වන්නේ අතීතයේදී සිදු වූවැයි කියන බරපතළ ගනයේ මානව හිමිකම් උල්ලංඝනය වීම්වලට අමතරව ශ්‍රී ලංකාව ඉතා වේගයෙන් මානව හිමිකම් අතින් පසුගාමීත්වයට පත්වෙමින් ඇති බවයි. එවන් වාතාවරණයක් තුළදී ලැබෙන මෙවැනි ආධාර අදාළ රාජ්‍ය හා රාජ්‍ය නොවන පාර්ශ්වකරුවන් විසින් වඩාත් ඵලදායී ලෙස ආයෝජනය කළ යුතු වේ.

මානව හිමිකම්වලට අයත් වන්නේ යුද අපරාධ, අතුරුදන් කරවීම් හෝ නීතියේ ආධිපත්‍ය අතික්‍රමණය කිරීම් පමණක්ම නොවන බව වටහාගත යුතු වේ. මානව හිමිකම් කෙරෙහි වටිනාකමක් ලබා දෙන්නේ නම් හෝ ඒ සඳහා අවම වශයෙන් කැපවන්නේ නම් අවධානය යොමු කළ යුතු බොහෝ දේ වේ. රටක් හෝ සමාජයක් ලෙස තමුන්ගේ රටේ ළමයින්, කාන්තාවන්, ආබාධිත ජනතාව, LGBTQ ප්‍රජාවගේ අයිතිවාසිකම් වෙනුවෙන් කෙතරම් අවධානයක් යොමු කරන්නේද මත මෙන්ම මරණ දණ්ඩනය පැමිණවීම වැනි දියුණු සමාජයක් තුළ පිළිගැනීමට අපහසු නීති පද්ධතියන් ක්‍රියාත්මක වන්නේද යන කාරණා මත අදාළ රට මානව හිමිකම්වලට කෙතරම් වටිනාකමක් ලබා දෙන්නේද යන්න තීරණය වේ.

සංචාරක කර්මාන්තය මෙන්ම ඇඟලුම් වැනි අපනයන කර්මාන්තයන් කෙරෙහි ආර්ථිකයේ වැඩි බරක් තබා ඇති රටක් ලෙස ශ්‍රී ලංකාව එහි මානව හිමිකම් සහ සමානාත්මතාව කෙරෙහි බරපතළ අවධානයක් යොමු කළ යුතු වේ. විශේෂයෙන්ම කම්කරු අයිතිවාසිකම් සහ අදාළ ක්ෂේත්‍රයන්ගේ සම අවස්ථා ලබාදීම අතින් රජයේ සහ පෞද්ගලික අංශයේ ආයතන තුළ පවත්නා තත්ත්වයන් වඩාත් සැලකිල්ලට ගත යුතු වන්නේ යුරෝපීය වෙළෙඳපොළ ඇතුළුව අනෙකුත් බොහෝ දියුණු රටවල් වෙනත් රටවල් සඳහා සිය වෙළෙඳපොළ විවෘත කිරීමේදී අන් කවරදාටත් වඩා අවධානයක් යොමු කරන බැවින්ය. අප වැනි රටවල්වලට GSP වැනි සහන ලබා දෙනවිටදී පවා මෙවන් බොහෝ කරුණු කාරණා වෙත අවධානය යොමු කරන බව අප විසින් සිහි තබා ගත යුතු වේ.

රුවන්වැලි මහා සෑය සාදා නිම කිරීමට පෙර මරණ මංචකයේ සිටි දුටුගැමුණු රජුගේ සිත සැනසීම පිණිස සද්ධාතිස්ස රජු විසින් පිරුවටවලින් එතෙක් නිම නොකළ සෑය වසා රජුගේ සිත සතුටු කළ බව ජනප්‍රවාදයේ එයි. පිළිගත යුතුම කාරණයක් වන්නේ අද වන විටත් ශ්‍රී ලංකාව තුළ බොහෝ අංශයන්ගෙන් විවිධාකාර ලෙස මානව හිමිකම් උල්ලංඝනය වීම් හෝ අතපසු වීම් සිදුවන බවයි. අදටත් පොලිස් ස්ථාන තුළ මෙන්ම හිරගෙවල් තුළ සිදුවන අමානුෂික පහරදීම් මෙන්ම සැකකරුවන් සැකකටයුතු ලෙස මිය යෑම් වාර්තා වන බව අමතක කළ නොහැකි සත්‍යකි. එබැවින් රටක්, රජයක් සහ සමාජයක් ලෙස අප විසින් සිදුකළ යුතු වන්නේ ලැබෙන්නා වූ මෙවන් මූල්‍ය ආධාර නිසි සේ කළමනාකරණය කොට අප රටේ මානව හිමිකම් සුරැකීම දියුණු කිරීම විනා එවන් ගැටලු මෙරට නැති බව කියමින් සුදුපිරුවටවලින් මහ පොළොවේ සත්‍ය වසන් කිරීමට කටයුතු කිරීම නොවන බව අප තරයේ විශ්වාස කරන්නෙමු.

විසංවාද

ස්ත්‍රීන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය ගැන පුළුල් කතිකාවතක් ඕනෑ

කැලණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ, අධිකරණ වෛද්‍ය විද්‍යාව පිළිබඳ මහාචාර්ය

අනුරුද්ධ එස්. එදිරිසිංහ

මෑතකදී ස්ත්‍රී - පුරුෂ සමාජභාවය පිළිබඳ අධ්‍යයනයක ප්‍රතිඵල ඇතුළත් වාර්තාවක්ද ඔබ ඇතුළු පිරිස එළිදක්වනු ලැබුවා. එම වාර්තා ඔස්සේ අනාවරණය වුණු ස්ත්‍රී - පුරුෂ සමාජභාවය හා සම්බන්ධ තොරතුරු ඇසුරින් මේ ප්‍රචණ්ඩත්වය ඔබ හඳුනාගන්නේ කෙසේද?

ස්ත්‍රී - පුරුෂ සමාජභාවය හා සම්බන්ධ ප්‍රචණ්ඩත්වය පුළුල් පරාසයක් තුළ දිවයන තත්ත්වයක්. සරලව කිව්වොත් බස් රථවල සිදු කෙරෙන හිරිහැර කිරීම දණ්ඩ නීති සංග්‍රහයේ තුන්සිය හතළිස් පහ වගන්තිය යටතට ගැනෙන එවැනි වැරැද්දක්. එවැනි අඩු මට්ටමේ ප්‍රචණ්ඩත්වයක සිට ස්ත්‍රී දූෂණය හා මිනීමැරුම දක්වාම මෙම ප්‍රචණ්ඩත්වය පැතිර තිබෙනවා. මේ පිළිබඳ නිර්වචනයන් එක් එක් ආයතන මට්ටමින් යම් වෙනස්කම් සහිතව පවතිනවා. මම වෛද්‍යවරියක් විදිහට ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිර්වචනය අනුව පැහැදිලි කළොත්, මේක සෞඛ්‍යමය අංශයෙන් අවධානය යොමුකළ යුතු කාරණයක්. මෙහිදී කායික හිංසනය, වාචික හිංසනය සහ මානසික හිංසනය කියන තත්ත්වයන් තුනම ඇතුළත් වෙනවා. ලෝක මට්ටමින් මේ ප්‍රචණ්ඩත්වය පාලනය කිරීමට උත්සාහ කළේ නීතිය උපයෝගී කරගෙන. නමුත් ඒක සාර්ථක වුණේ නැහැ. මොකද මේ ප්‍රචණ්ඩත්වයට ගොදුරුවූ කෙනකුට ඉන් පිටතට පැමිණ යථා තත්ත්වයට පත්වීමට උපකාර තිබිය යුතුයි. මම අධිකරණ වෛද්‍ය විශේෂඥවරියක් විදිහට ජීවත්වන්නවුන් පමණක් නෙමෙයි, මරණයට පත්වූවන් පවා ප්‍රචණ්ඩත්වයට ලක්ව තිබෙන ආකාරය දකිනවා.

ස්ත්‍රී - පුරුෂ සමාජභාවය හා සම්බන්ධ ප්‍රචණ්ඩත්වය ලංකාවේ පමණක් නෙමෙයි, ගෝලීයව බරපතළව පවතින ප්‍රශ්නයක් බව මේ වන විට මුළු ලෝකයම අවබෝධ කරගෙන තිබෙනවා. ඒ නිසා තමයි හැම වසරකම මේ පිළිබඳව දැනුවත් කිරීම්, ඊට එරෙහිව පියවර ගැනීම් ඉස්මතු කෙරෙන ආකාරයට මෙම අන්තර්ජාතික වැඩසටහන් ක්‍රියාත්මක වෙන්නෙ. ශ්‍රී ලංකාවේ මේ පිළිබඳව කටයුතු කරන රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන හැම එකක්ම මේ කාල සීමාවේදී මේ පිළිබඳ කතිකාවත අලුත් කරනවා. මොකද මේ ප්‍රචණ්ඩත්වය ස්ත්‍රී - පුරුෂ සමාජභාවය නිසාම සිදුවන දෙයක්. අපි මේ කාලයේදී සමානාත්මතාවක් ගැන කතා කරනවා. ඒ වගේම සාධාරණත්වය ගැන කතා කරනවා. මොකද මේක මෙම මාතෘකාව පිළිබඳ දැනුවත් කිරීම් ජනතාව වෙත ගෙන යාහැකි කාලයක්. ස්ත්‍රී-පුරුෂ සමාජභාවය හා සම්බන්ධ ප්‍රචණ්ඩත්වය මානව අයිතිවාසිකමක් උල්ලංඝනය කිරීමක් ලෙස තමයි අපි සැලකිය යුත්තේ.

ස්ත්‍රී ඝාතන යනුවෙන් හඳුනාගන්නේ කුමක්ද?

මේ සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල සමඟ එක්ව ඔබ අධ්‍යයනයක් සිදුකරලා තියෙනවා. මේ සම්බන්ධයෙන් සිදුකළ පර්යේෂණයෙන් අපි බලාපොරොත්තු වෙන්නෙ ලංකාවේ අස්වාභාවික කාන්තා මරණ සිදුවෙන්නේ කොහොමද කියන එක සොයා බැලීම. එතැනදී අනතුරු, සියදිවි හානිකර ගැනීම සහ මනුෂ්‍ය ඝාතනය කියන කොටස් තුනම ඇතුළත් වෙනවා. මේ පර්යේෂණයේ වාර්තාව එනකම් ලංකාවේ අපිට මේ සම්බන්ධයෙන් වෙන්කරගත් දත්ත පැවතුණේ නැහැ. උදාහරණයක් විදිහට පොලිසියේ වෙබ් අඩවියට ගිහින් විමසා බැලුවොත් අපිට දකින්න ලැබෙන්නේ සමස්ත රටේම මනුෂ්‍ය ඝාතන ප්‍රමාණය. යුද්ධය පැවැති සමයේ මෙවැනි මනුෂ්‍ය ඝාතනවල ඉහළ අගයක් පැවතුණා. යුද්ධය අවසන්වීමෙන් අනතුරුව දෙදාස් දහතුන වසර පමණ වන විට මනුෂ්‍ය ඝාතන පන්සීයක්, හයසීයක් අතර සංඛ්‍යාවක් තමයි පැවතුණේ. නමුත් මේ තුළ කාන්තා ඝාතන කොපමණ සංඛ්‍යාවක් තියෙනවද කියල සොයා ගැනීම අසීරුයි. ඒ නිසා තමයි අපි 'අස්වාභාවික කාන්තා මරණ' කියන මාතෘකාව අරගෙන පර්යේෂණයක් සිදුකරන්නේ. දෙදාස් දහතුන සහ දාහතර කියන වසර වෙනකොට මේ පිළිබඳ දත්ත නැහැ කියන කාරණය ගැන කතිකාවතක් මතුවුණා. ඒ අනුව තමයි අපි එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල සමඟ එක්ව මේ පර්යේෂණය ආරම්භ කරන්නේ. යුරෝපා රටවල සහ ඇමෙරිකාවේ මේ පිළිබඳ පර්යේෂණ තියෙනවා. නමුත් ආසියාතික රටවල මෙවැනි පර්යේෂණ සිදුකර තිබුණේ නැහැ. ඒ නිසා තමයි මෙම පර්යේෂණය පිළිබඳව ව්‍යාපෘති යෝජනාවක් කැලණිය විශ්වවිද්‍යාලය හරහා එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල වෙත ලබා දුන්නේ.

මෙහිදී ස්ත්‍රී - පුරුෂ සමාජභාවය හා සම්බන්ධව විමර්ශනය කළ හැකි, අධිකරණ වෛද්‍ය විද්‍යාව පිළිබඳ දැනුමක් ඇති, විශේෂඥ කණ්ඩායමක් සම්බන්ධ කරගැනීමට අපිට සිදුවුණා. එපමණක්ද නෙමෙයි, එතැනින් එහා ගිය සාමාජයීය සහ සංස්කෘතික තත්ත්ව මෙහිදී සලකා බැලිය යුතුව තිබුණා. මිනීමැරුමකින් අනතුරුව එහි බලපෑම අදාළ පවුලට මෙන්ම සමාජයටම සිදුවන්නේ කෙසේද යන්න සොයා බැලිය යුතු වුණා. මෙවැනි සිදුවීම්වලදී 'පුළුල් සහ ගැඹුරු' යන පදනම් දෙකින්ම විමර්ශනය කළ යුතුයි. මේ සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ ස්ත්‍රී - පුරුෂ සමාජභාවය පිළිබඳ අධ්‍යයන කේන්ද්‍රයේ මහාචාර්ය මෛත්‍රී වික්‍රමසිංහ මැතිනියගේ ප්‍රධානත්වයෙන් ආරම්භයක් ලබා ගන්නවා. වෛද්‍ය පීඨය විදිහට එතැනදී අපි ඊට සම්බන්ධ වෙනවා. දෙදාස් දහතුන, දාහතර සහ පහළොව කියන වසරවල්වල දත්ත පදනම් කරගෙන තමයි අපි මේ අධ්‍යයනය සිදු කළේ. මේ සඳහා රට පුරා ඉන්න හදිසි මරණ පරීක්ෂකවරුන්ගේ සහ අධිකරණ වෛද්‍යවරුන්ගේ ලිපිගොනු අධිකරණ අමාත්‍යාංශයේ හා පොලිසියේ විශේෂ අවසරයක් සහිතව විමර්ශනය කිරීමට සිදුවුණා.

මේ සමීක්ෂණය අපි බස්නාහිර, දකුණ, උතුරුමැද, නැඟෙනහිර සහ සබරගමුව යන පළාත් පහක් ආවරණය වන ආකාරයට සිදු කළා. එතැනදී රටේ සමස්ත භූමි ප්‍රමාණයෙන් සියයට හැත්තෑවකට ආසන්න ප්‍රමාණයක් ආවරණය වුණා. දෙදාස් විස්ස වසර වෙනකම් පවතින සංඛ්‍යාලේඛනවලට අනුව ශ්‍රී ලංකාවේ වාර්ෂික කාන්තා ඝාතනවල සාමාන්‍ය සියයත්, එකසිය විස්සත් අතර අගයක්. ඒ කියන්නේ රටේ සමස්ත ඝාතනවලින් පහෙන් එකක් විතර. ලෝකයේ සමස්ත ඝාතන අනුපාතයත් මීට සමානයි. සමස්ත ලෝකයේ සංඛ්‍යා ලේඛනවලට අනුව කාන්තා ඝාතනවලින් සියයට පනහක් පමණ සමීපතම සහකරුවා අතින් සිදුවුණු ඝාතන. ඒත් අපේ රටේ මේ අගය මීට වඩා ඉහළයි. ලංකාවේ මේ අගය සියයට හැට දෙකක් විතර වෙනවා. මේවා ගේ ඇතුළේ සිදුවන මරණ. ඒ වගේමයි ඝාතනයට ලක්වන කාන්තාවන්ගෙන් සියයට අසූ හතරක්ම තමන්ව ඝාතනය කරන පුද්ගලයව දන්නවා. ඒකෙනුත් මරණ සියයට හැත්තෑ පහක්ම සිදු වෙන්නේ ගේ ඇතුළේ. පළාත් අතරත් ඝාතන අනුපාතවල සුළු සුළු වෙනස්කම් තියෙනවා. අපි සලකා බලපු වසර තුනේදීම වැඩිම මරණ වාර්තා වුණේ දකුණු සහ සබරගමු පළාත්වලින්.

අධ්‍යයනයෙන් පෙනී යන්නේ බොහෝ අපරාධකරුවන් සමීප සහකරුවන් බවයි. මෙම සමීප සහකරුගෙන් එල්ලවන ප්‍රචණ්ඩත්වය ගැන විස්තර කළොත් ?

මෙම මරණවලින් බහුතරයක් සිදුකරලා තියෙන්නේ පිහි ඇනුම්වලින්. ඊළඟට වාර්තා වෙන්නේ හිසට සිදුකෙරුණු පහරදීම්වලින් සිදුවුණු මරණ. මේකේ තියෙන දුක්ඛිතම තත්ත්වය තමයි සියදිවි නසාගැනීම්. ලංකාවේ ස්ත්‍රී ඝාතන වගේ හතර ගුණයක් කාන්තා සියදිවි නසා ගැනීම් වාර්තා වෙනවා. මේකට බලපාලා තියෙන්නෙත් සමීප සහකරුගේ බලපෑම. මේ අවස්ථා දෙකේදීම සමීපතම සහකරු සමඟ ඇතිවෙන ප්‍රශ්න නිරාකරණය කරගන්න බැරි බව තමයි ඔප්පු වෙන්නේ. මේකෙන් මතුවෙන කාරණය තමයි, ගෙදර ඇතුළේ තියෙන ප්‍රශ්නය විසඳගන්න බැරුව අපි කොහොමද රටේ ප්‍රශ්න විසඳන්නේ කියන එක. මේකට අනිවාර්යයෙන්ම දැනුවත්වීම් සිදුකළ යුතුයි. මොකද ගෙදරින් පටන්ගන්න ප්‍රචණ්ඩත්වය තමයි මහා සමාජය දක්වා ගමන් කරන්නේ.

අධිකරණ වෛද්‍ය විද්‍යාව පිළිබඳ මහාචාර්යවරියක වශයෙන් ස්ත්‍රී -පුරුෂ සමාජභාවය හා සම්බන්ධ ප්‍රචණ්ඩත්වය හේතුවෙන් සිදුවන අස්වාභාවික මරණ පිළිබඳ අවධානය යොමු කිරීම සහ ඒවා වැළැක්වීමට ගත හැකි පියවර ඔබ පෙන්වාදෙන්නේ කොහොමද?

ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව අපේ සමීක්ෂණ වාර්තාවේ වෙනම පරිච්ඡේදයක්ම වෙන් කරලා තියෙනවා. එක ක්‍රමයක් තමයි අධ්‍යාපනය සහ දැනුවත් කිරීම. ජනමාධ්‍ය වෙතත් මෙහිදී විශාල වගකීමක් පැවරෙනවා. මේ ප්‍රචණ්ඩත්වයේ අත්තිවාරම දිහා බැලුවහම පේනවා, ස්ත්‍රී - පුරුෂ සමාජභාවය පිළිබඳව සමාජයේ පවතින ආකල්ප, එය ඔඩු දිවීමට බලපාලා තියෙනවා කියලා. අපි ජීවිතය ගත කරන අතරතුර තමයි සමාජයෙන් ඉගෙන ගන්නේ. තාත්තා අම්මට පහරදෙනවා බලාගෙන ඉන්න පුතා ඔහුගේ බිරියට පහරදීම පුදුමයක් නෙමෙයි. මේ සම්මුඛ සාකච්ඡාවත් ප්‍රචණ්ඩත්වය පිළිබඳව දැනුවත් කිරීමේ එක් පියවරක්. මේක ප්‍රශ්නයක් විදිහට අපි ඉස්සරහ තියෙනවා, මේ ප්‍රශ්නය දෙස අපි පිළිකුල් සහගතව බැලිය යුතුයි කියන ආකල්පය අප විසින් වැඩිදියුණු කළ යුතුයි. එතැනින් තමයි පටන්ගත යුත්තේ. ඉන් අනතුරුව මේක විෂයමාලා තුළට පැමිණිය යුතුයි. එක්දාස් නවසිය අනූ ගණන්වල වෛද්‍ය පීඨ විෂයමාලා තුළ මේ ගැන සඳහන් නොවුණාට අද ඒ තත්ත්වය වෙනස්වෙලා. අද වෛද්‍යවරයා දැනුවත්ව සිටිය යුතුයි, කාන්තාවගේ සමස්ත ආරක්ෂණය වෙනුවෙන් කටයුතු කළයුත්තේ කෙසේද කියන එක ගැන.

මෙහිදී මූලිකවම අධ්‍යයනය සිදුකළේ මියගිය පිරිස පිළිබඳවද?

ඔව්. ඒත් මිය යෑමට පෙර ජීවත්ව සිටින පුද්ගලයන් වෙනුවෙන් සිදුකළයුතු වැඩ කොටස පිළිබඳවත් දැනුවත් කළ යුතුයි. එතැනදී සෞඛ්‍යමය, නීතිමය, ආරක්ෂණමය යන සියලු පියවර වෙනුවෙන් සමාජයේ සියලුදෙනාම එකට එක්කළ යුතුයි. අපි හුඟක් තැන්වලදී දැක්ක කාරණයක් තමයි මේක ගේ ඇතුළේ ප්‍රශ්නයක්, අපිට රණ්ඩුවෙනවා ඇහුණට අපි මැදිහත් වුණේ නැහැ කියන කතාව සමීපතමයන් කියන එක. ඒ ආකල්ප වෙනස් කළ යුතුයි. අපේ රටේ, පවුල ඇතුළේ ප්‍රශ්න විසඳා ගැනීමේදී උපදේශනයට යොමුවෙන්නේ ඉතාම අඩු පිරිසක්. උපදේශනය නැතුව නෙමෙයි. අතීතයේ පටන් පන්සලෙන්, පල්ලියෙන් සහ තවත් සමාජ සේවා ආයතන හරහා මේ කටයුත්ත සිදුකෙරුණා. එත් න්‍යෂ්ටික පවුල් ඒකක වැඩිවෙන්න වැඩිවෙන්න මානසික සෞඛ්‍ය සම්බන්ධ උපදේශනය වැඩියෙන් අවශ්‍ය වෙනවා. ඒත් අවශ්‍යතාවට සාපේක්ෂව රට තුළ එවැනි සේවාවන් අඩුයි. මේ ප්‍රශ්නයට පිළිතුර හිංසනය නෙමෙයි කියන කාරණය පැහැදිලි කිරීම සඳහා පවතින සේවා සෑහෙන්න වැඩිදියුණු කළ යුතුයි. උදාහරණයක් විදහට කාන්තාවකට හෝ ළමයකුට තමන්ගේ නිවෙස ආරක්ෂිත ස්ථානයක් නොවෙනවා නම්, යාහැකි ආරක්ෂිත ස්ථානයක් තිබිය යුතුයි. ඒ වගේම සෞඛ්‍යමය ගැටලුවලට මුහුණපාලා එන පිරිස්වලටත් පහසුකම් සැපැයීමේ සේවා තිබිය යුතුයි. එම සේවා සපයන පිරිස්වලත් ස්ත්‍රී - පුරුෂ සමාජභාවය පිළිබඳ ආකල්ප වෙනස් කළ යුතුයි. රණ්ඩුවක් විසඳාගන්න පොලිසියට යනකොට එතන ඉන්න නිලධාරීන්ට කාරණය ගැන නිවැරදි අවබෝධයක් තිබිය යුතුයි.

අපි අධ්‍යයනය කරපු මිනීමැරුම් සහ සියදිවි හානිකර ගැනීම්වලින් සියයට තිහකට වැඩි ප්‍රමාණයක් පිරිස දෙවරකට වැඩි වාර ගණනක් විසඳුමක් වෙනුවෙන් උදවු ඉල්ලගෙන ගිහින් තියෙනවා. සියයට හැටක් විතර පිරිස එක සැරයක් ගිහින් තියෙනවා. නමුත් ප්‍රතිඵලයක් ලැබිලා නැහැ. ඒකෙන් කියන්නේ ක්‍රමයේ අසමත් භාවයක් තියෙනවා කියන එකනේ. ඒකයි මම කියන්නේ මේක ආකල්ප හා බැඳුණු දෙයක් කියලා. ඒ නිසා ස්ත්‍රී - පුරුෂ සමාජභාවය හා සම්බන්ධ ප්‍රචණ්ඩත්වය කියන මාතෘකාව පවුලෙන් පිටතට අරගෙන සමාජය තුළ ඒ පිළිබඳව පුළුල් කතිකාවතක් ඇති කළ යුතුයි.

සංලාපය - රසිඳු සහස්